# උපදෙස් පත්‍රිකාව

## අයදුම්කරුවන් සඳහා උපදෙස්

මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් සිදු කරන බැවින් ඒ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරනු මැනවි.

### පියවර (01)

### අයදුම්පත් ගාස්තු ගෙවීම

- ඔබ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු වශයෙන් රුපියල් **1000/= ක්** ගෙවීම අනිවාර්ය වේ. (මහජන බැංකුව ගංගොඩවිල ශාඛාවට බැර වන පරිදි ඕනෑම මහජන බැංකුව ශාඛාවකින් මෙම මුදල් තැන්පත් කිරීම සිදු කළ හැකිය.

| පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|
| අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (Intake 15) | 013010001322 |

- මුදල් තැන්පතු රිසිට් පතේ පාඨමාලාවට අයදුම්කරන්නාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකතන අංකය ඇතුලත් කරන්න.
- බැංකු රිසිට් පතෙහි ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න.
- ඔබ විසින් ගෙවන ලද අයදුම්පත් ගාස්තුව කිසිඳු හේතුවක් මත නැවත නොගෙවන බව ද දන්වා සිටිමු.

පාඨමාලා ගාස්තුව ඔබට වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය රුපියල් හතළිස් දාහක් (40,000/=) පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතු අතර දෙවන වාරිකය රුපියල් තිස් පන්දාහක් (35,000/=) පාඨමාලාව ආරම්භ වී මාස තුනක් ඇතුළත ගෙවිය යුතුය. පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් එක් සිසුන්ට අනන්‍ය වූ බැංකු ගිණුම් අංක පවතින අතර අදාළ ගිණුම් අංක පාඨමාලාව සඳහා තේරී පත් වූ පසු ඔබට ලබාදෙනු ඇත.

### පියවර (02)

ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු ගෙවීමෙන් අනතුරුව පහත ලින්ක් එකට පිවිස පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

**https://docs.google.com/forms/d/e/1FAIpQLSczsx4e2xBzOBhQocVbVtpVO44q2FGkBxSzYUV6a0XiiQKsGw/viewform?usp=header**

Diploma in Criminology

**පියවර (03)**

ලබාදී ඇති අයදුම්පත්‍රය අයදුම්කරුට එක් වරක් පමණක් පිරවිය හැකි බැවින් එය ඉතාමත් සැලකිලිමත්ව පිරවීමට වගබලා ගන්න. ඔබගේ නිවැරදි තොරතුරු පමණක් ලබා දී ඇති ගූගල් ෆෝරමයේ නිවැරදි ස්ථානයේ නියමිත පරිදි පුරවන්න.

එසේම ඔබගේ පෞද්ගලික ලිපිගොනුව තුළ අඩංගු විය යුතු පහත සඳහන් ලේඛනවල මුල් පිටපත් වල (Original certificates) PDF පමණක් උඩුගත (Upload) කළ යුතුය. පහත ලිපිගොනු උඩුගත කිරීමට ප්‍රථමයෙන් එම PDF ලිපිගොනු ඔබගේ නමින් Rename කරන්න.

I. ජාතික හැඳුනුම්පත් පිටපත (මුලකුරු සමඟ නම M L Perera)
II. උප්පැන්න සහතිකයේ පිටපතක්
III. අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතික පිටපත්
IV. වෙනත් අධ්‍යාපන සුදුසුකම්හි සහතික සහතික පිටපත්
V. සේවා සහතිකය.
VI. අයදුම්පත් ගාස්තු ගෙවන ලද බැංකු රිසිට් පතෙහි දෙවන පිටපත

**පියවර 04**

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් තැපැල වෙත අප විසින් එවන ලද ඔබගේ අයදුම්පත්‍රයේ පිටපත භාගත (Download) කර ගන්න.

**පියවර 05**

එසේ භාගත කරගත් අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැල හරහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උඩුගත කරන ලද මුල් සහතිකපත්හි සත්‍ය පිටපත් (True Copy) බවට සහතික කරන ලද පිටපත් සමඟ අමුණා පහත ලිපිනයට (2025/07/20) දින හෝ එදිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**පාඨමාලා සමායෝජක**

**අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**

**ගංගොඩවිල,**

**නුගේගොඩ.**

Diploma in Criminology

**පොදු උපදෙස්**

- මෙම උපදෙස් මාලාවට අනුකූල නොවන ලෙස එවන අයදුම්පත්‍ර හා 2025/07/20 දිනෙන් පසු ලැබෙන අයදුම් පත්‍ර සලකා බලනු නොලැබේ.
- ඔබගේ අයදුම් පත්‍රය අනුව අදාළ පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණයට ඔබව තෝරා ගනු ලැබුවහොත් ඒ බව පෞද්ගලිකව දන්වනු ලබන අතර පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ඒ අනුවය.
- පාඨමාලා ගාස්තු තම සේවායෝජකයා මගින් ගෙවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අයදුම් පත තම සේවා යෝජකයා මගින් එවීම ප්‍රයෝජනවත් විය හැකිය.

**සැ.යු. - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර (අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලා 2025/2026) ලෙස සඳහන් කළ යුතුය.)**

**************************************************

Diploma in Criminology